රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
அரசாங்க நிர்வாக மற்றும் உள்நாட்டலுவல்கள் அமைச்சு
Ministry of Public Administration and Home Affairs

නිදහස් චතුරස්‍රය, කොළඹ 07. சுதந்திர சதுக்கம், கொழும்பு 07. Independence Square, Colombo 07.

දුරකථන / தொலைபேசி / Telephone : (94) 011-2696211-13 | ෆැක්ස් / பெக்ஸ் / Fax : (94) 011-2695279 | ඊ-මේල් / இ-தபால் / E - mail : secretary@pubad.gov.lk | වෙබ් අඩවිය / இணைத்தளம் / Web Site : www.pubad.gov.lk

මගේ අංකය / எனது இல / My No : COM2/TRANS/03/2012

ඔබේ අංකය / உமது இல / Your No :

දිනය / திகதி / Date : 2012.01.17

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන් සහ
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**<u>ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරුවීම් -2012</u>**
**<u>නිලධාරීන් නිදහස් කිරීම</u>**

2012.01.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද වාර්ෂික ස්ථාන මාරුවීම් හා සමාලෝචන කමිටු තීරණ දැනටමත් සියලුම ආයතන වෙත යවා ඇත.

02 මෙම මාරුවීම් ක්‍රියාත්මක කිරීමේදී අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් නිලධාරීන් නිදහස් නොකළයුතු බවට ඇතැම් දෙපාර්තමේන්තු ප්‍රධානීන් නිකුත්කළ ලිපි පිළිබඳව මගේ අවධානය යොමු විය.

03. වාර්ෂික ස්ථාන මාරු ක්‍රමය රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් වන අතර ඒ සඳහා වෘත්තීය සමිති ඇතුළු රාජ්‍ය නිලධාරීන් වසරේ මාස 09ක් තුළම පරිශ්‍රමයක් හා මූල්‍යමය සම්පත් වැය කරති. වසර ආරම්භයේ සිට අදාළ නිලධාරීන් ස්ථාන මාරු කරන බව සියලුම ආයතන ප්‍රධානීන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඇතුළු සියලුදෙනා කල්වේලා ඇතුව දැනුවත්ව සිටිති. ඒ අනුව තම කාර්ය මණ්ඩලය කළමනාකරණය කරගැනීම ආයතන ප්‍රධානීන්ගේ වගකීමකි.එසේ නොමැතිව යම් ආයතනයක කළමනාකරණ සහකාර සේවයේ නිලධාරියෙක් ස්ථාන මාරු වී ගිය පසු ආයතනයේ කටයුතු අඩාල වන බව පැවසීම ආයතන ප්‍රධානීන්ගේ කළමනාකරණ නොහැකියාව ප්‍රකාශ කිරීමක් වේ.

04. මේ තත්ත්වය මත මාරුවීම් නියෝග ලැබී ඇති ඒකාබද්ධ සේවයේ සියලුම නිලධාරීන්ට නියමිත දිනට නව සේවා ස්ථානයේ රාජකාරී බාරගැනීමට හැකිවන පරිදි නිදහස් කර හැරිය යුතු බව මෙයින් දැනුම් දෙමි.

05. මාරුවීම් නියෝග පැහැර හරින නිලධාරීන් සම්බන්ධව අංක 1589/30 අතිවිශේෂ ගැසට් පත්‍රයේ සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති පරිදි කටයුතු කරන අතර, එම නිලධාරීන්ට, නියමිත දිනෙන් පසු කාලයට රැඳී සිටින අමාත්‍යාංශයෙන්/ දෙපාර්තමේන්තුවෙන්/ කාර්යාලයෙන් වැටුප් ගෙවීමද අනුමත නොකරමි.මෙම නියෝග ක්‍රියාත්මක නොකිරීමෙන් ඇති වන තත්ත්වයන්හි ප්‍රතිඵල සම්බන්ධයෙන් නිලධාරීන් නිදහස් නොකරනු ලබන ආයතන ප්‍රධානීන්ද වගකිවයුතු බව වැඩිදුරටත් දන්වමි.

පී.බී. අබේකෝන්
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.

පිටපත් - 01. ජනාධිපති ලේකම් - දැ.ගැ.ස.
02. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - දැ.ගැ.ස.
03. විගණකාධිපති - දැ.ගැ.ස